තේ තතු
ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය
ISSN 1391 - 6785 වෙළුම 7 කාණ්ඩය 1 2010 ඔක්තෝම්බර්

22 FEB 2011
TEA RESEARCH ... LIBRARY

# කුඩා තේ වතු ක්ෂේත්‍රය සඳහා පොහොර භාවිතය පිළිබඳ අතුරු නිර්දේශයක්

මේ වන විට කුඩා තේ වතු අංශය මුහුණ පා සිටින පාංශු පෝෂණය සහ පොහොර භාවිතය පිළිබඳ ගැටළු අවම කිරීමේ අරමුණින් පොහොර භාවිතය පිළිබඳ අතුරු නිර්දේශයක් ඉදිරිපත් කිරීමට තේ පර්යේෂණ ආයතනය පියවර ගන්නා ලදී.

පසුගිය කාලයේදී කළ පර්යේෂණ මගින් පැහැදිලි වූයේ පහතරට, මැද රට සහ ඌව කලාප වල පොටෑසියම්, මැග්නීසියම් සහ සල්ෆර් මට්ටම් කැපී පෙනෙන ලෙස අඩු වීමක් පෙන්නුම් කරන බවත් එම කලාප වල පසෙහි පාංශු පෝෂක රඳවා ගැනීමේ අඩු හැකියාව ඊට හේතු වන බවත්ය.

එම තත්ත්වය මග හරවා පසෙහි පාංශු පෝෂණය පවත්වා ගැනීම සඳහා අස්වනු ප්‍රමාණය මත පදනම්ව අතුරු පොහොර මිශ්‍රණ දෙකක් (U 346, U 709) නිර්දේශ කෙරිණි. ·

මෙම උපදෙස් පත්‍රිකාව හැරුණු විට පසුගිය කාලයේදී තේ පර්යේෂණ ආයතනය විසින් තේ තවාන් පාලනය සහ තේ ටෝට්‍රික්ස් කළමනාකරණ පිළිබඳ වූ නව උපදෙස් පත්‍රිකා දෙකක් ප්‍රකාශයට පත් කරන ලදී.